# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## 4

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 10 ශ්‍රේණිය
## ගිණුම්කරණය හැඳින්වීම

1) ගිණුම්කරණයේ මූලික අරමුණ කුමක්ද?

    i. ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන් සටහන් කිරීමයි.
    ii. ව්‍යාපාරයේ ගනුදෙනු මූලික පොත්වල සටහන් කිරීමයි.
    iii. ඇල්මැති පාර්ශ්වයන්ගේ තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයීමයි.
    iv. ව්‍යාපාර ඒකකයක තොරතුරු කළමනාකරණයට වාර්තා කිරීමයි.

2) ව්‍යාපාරයක් කෙරෙහි ඇල්මැති පාර්ශ්වයන් යනුවෙන් අදහස් වන්නේ කවුරුන්ද?

    i. ව්‍යාපාර තොරතුරු කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ය.
    ii. ව්‍යාපාරයේ සේවකයන් සහ අයිතිකරුවන්ය.
    iii. ව්‍යාපාරයට ප්‍රාග්ධනය සපයන පාර්ශ්වයන්ය.
    iv. ව්‍යාපාරයට ණය සැපයීම සඳහා උනන්දු වන බැංකු සහ මූල්‍යායතනයි.

3) ව්‍යාපාර තොරතුරු කෙරෙහි උනන්දුවක් දක්වන අභ්‍යන්තර පාර්ශ්වයන් වන්නේ,

    i. අයිතිකරුවන් සහ මහජනතාවය.
    ii. අයිතිකරුවන් සහ සේවකයන්ය.
    iii. ගනුදෙනුකරුවන් සහ සැපයුම්කරුවන්ය.
    iv. බැංකු සහ මූල්‍යායතනයි.

4) ව්‍යාපාරයේ තොරතුරු ඇල්මැති පාර්ශ්වයන් වෙත ලබා දෙන්නේ කුමන වාර්තා මඟින්ද?

    i. විවිධ ගිණුම් මඟින්
    ii. මුදල් පොත මඟින්
    iii. මූල්‍ය ප්‍රකාශ මඟින්
    iv. මූල්‍ය තත්ත්වය මඟින්

5) ව්‍යාපාරයක ගනුදෙනුවක් ලෙස අදහස් වන්නේ පහත කුමන කරුණද?

    i. ව්‍යාපාරය නගරයේ සිට කි.මී.1ක් දුරින් පිහිටීම.
    ii. ව්‍යාපාරයේ සේවකයන් දෙදෙනෙකු අලුතින් බඳවා ගැනීම.
    iii. ව්‍යාපාරයේ විදුලි බිල රු.5000 ක් ගෙවීම.
    iv. ව්‍යාපාරයේ නව ශාඛාවක් නගරයක විවෘත කිරීම.

6) පහත තොරතුරු ආශ්‍රයෙන් සිද්ධියක් ලෙස හඳුනා ගන්නේ කුමක්ද?

    i. වෙළෙඳ ලැබිය යුතු මුදලක් බොල්ණය බවට පත්වීම.
    ii. ව්‍යාපාරයේ භාණ්ඩ අත්පිට විකිණීම.
    iii. ව්‍යාපාරයේ ගොඩනැගිලි කුලියක් ගෙවීම.
    iv. අයිතිකරු විසින් අමතර ප්‍රාග්ධනයක් ව්‍යාපාරයට යෙදවීම.

7) ව්‍යාපාර වත්කමක් සම්බන්ධයෙන් වැදගත් වන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ

i. ව්‍යාපාරය විසින් අනාගතයේදී මිලට ගැනීමට තීරණය කිරීම.
ii. අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් ලෙස බිහිවීම.
iii. ව්‍යාපාරයට පාලනය කළ නොහැකි වීම.
iv. ව්‍යාපාරය විසින් ප්‍රතිලාභයක් නොලබා තිබීම.

8) ව්‍යාපාරයක ජංගම වත්කමක් ලෙස හඳුනාගත හැකි වන්නේ

i. ලී බඩු
ii. ඉඩම්
ii. ගොඩනැගිලි
iv. භාණ්ඩ තොගය

9) ව්‍යාපාරයක ජංගම නොවන වත්කමක් ලෙස හඳුනාගත හැකි වන්නේ

i. මුදල්
ii. ඉඩම්
ii. භාණ්ඩ තොගය
iv. ණයගැතියෝ

10) ව්‍යාපාර වගකීමක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ

i. ආර්ථික සම්පත් ව්‍යාපාරය තුළට ගලා ඒම.
ii. ආර්ථික සම්පත් පිටතට ගලා යාම.
iii. ව්‍යාපාරයට පාලනය කළ හැකි වීම.
iv. අනාගතයේදී සිදුවිය හැකි දෙයක් වීම.

11) ව්‍යාපාරයක ජංගම වගකීමක් ලෙස හඳුනාගත හැකි වන්නේ

i. අතැති මුදල
ii. වෙළෙඳ ණයහිමියන්
iii. භාණ්ඩ තොගය
iv. බැංකු ණය

12) ව්‍යාපාරයක ජංගම නොවන වගකීමක් ලෙස හඳුනාගත හැකි වන්නේ

i. දිගුකාලීන බැංකු ණය
ii. කෙටිකාලීන බැංකු ණය
iii. බැංකු අයිරාව
iv. වෙළෙඳ ණයහිමියන්

13) ව්‍යාපාරයක හිමිකම ලෙස ඔබ හඳුනා ගන්නේ

i. අයිතිකරුගේ බාහිර වගකීමයි.
ii. හිමිකරුවන් වෙනුවෙන් පවතින වත්කම් ප්‍රමාණයයි.
iii. හිමිකරුවන් වෙනුවෙන් පවතින වගකීම් ප්‍රමාණයයි.
iv. අයිතිකරු බැංකුවෙන් ලබා ගත් ණය ප්‍රමාණයයි.

14) හසාරා විසින් පවත්වාගෙන යන ව්‍යාපාරය රු.300,000ක බැංකු ණයක් යොදා ගෙන ඇත. මුළු වත්කම් ප්‍රමාණය රු.520,000කි. ව්‍යාපාරයේ හිමිකම කොපමණද?

i. රු.120,000
ii. රු.220,000
ii. රු.200,000
iv. රු.520,000

15) ව්‍යාපාරයක ලාභය යනු,

i. ආදායම් හා වියදමේ එකතුවයි.
ii. ආදායම් හා වියදමේ වෙනසයි.
iii. ආදායම් හා වත්කමේ වෙනසයි.
iv. හිමිකම සහ වත්කම අතර වෙනසයි.

16) ව්‍යාපාරයක ලාභය හා ආදායම් වැඩිවීමට හේතුවක් වන ගනුදෙනුවක් වන්නේ

i. අයිතිකරුගේ ගැනිලි
ii. අත්පිට ගැණුම්
iii. අත්පිට විකුණුම්
iv. බැංකු ණය ලබා ගැනීම

17) ව්‍යාපාරයක ගැනිලි යනුවෙන් අදහස් වනුයේ

i. අයිතිකරු යොදන අමතර මුදල්ය.
ii. ගනුදෙනුකරුවන්ට මුදල් ගෙවීමයි.
iii. අයිතිකරු විසින් සිදු කරන වත්කම් ඉවත් කර ගැනීමයි.
iv. ව්‍යාපාරයේ වියදම් ගෙවීමයි.

18) සිල්ලර වෙළෙඳසැලක් පවත්වාගෙන යනු ලබන දුවිදු වමෝද් පහත තොරතුරු ඔබට සපයා ඇත. ඒවා වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ලෙස වර්ගීකරණය කර දෙන ලෙස ඔහු ඉල්ලා සිටියි.(අදාළ තීරුවේ ✓ ලකුණ යොදන්න)

| අයිතමය | වත්කම් | වගකීම් | ආදායම් | වියදම් |
|---|---|---|---|---|
| මුදල් | | | | |
| බැංකු ණය | | | | |
| ණයගැතියෝ | | | | |
| විකුණුම් | | | | |
| තොගය | | | | |
| විදුලි බිල් ගෙවීම | | | | |
| ණය පොළිය | | | | |
| ඉඩම් | | | | |
| ගෙවිය යුතු වැටුප් | | | | |
| ලද පොළිය | | | | |
| ගෙවූ පොළිය | | | | |
| මෝටර් රථ | | | | |
| ලී බඩු | | | | |
| ණයහිමියෝ | | | | |
| බැංකු ශේෂය | | | | |
| බැංකු අයිරාව | | | | |

19. හසාරා විද්‍යානි ඇඟලුම් කම්හලක් පවත්වා ගෙන යනු ලබයි. ඇයගේ ව්‍යාපාරයට සම්බන්ධ පහත දැ දී ඇති වර්ගීකරණයට අදාළව වෙන් කර දෙන ලෙස ඉල්ලා සිටී (√ ලකුණ යොදන්න).

| අයිතමය | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|
| | ජංගම | ජංගම නොවන | ජංගම | ජංගම නොවන |
| ලබා ගත් බැංකු ණය | | | | |
| මසා නිම කළ ඇඳුම් | | | | |
| රෙදි මැසීමේ යන්ත්‍ර | | | | |
| අතැති මුදල | | | | |
| ව්‍යාපාරික ගොඩනැගිල්ල | | | | |
| ගෙවිය යුතු විදුලි බිල | | | | |
| රෙදි ප්‍රවාහනය කිරීමේ ලොරි රථය | | | | |
| ණයට විකුණා ඇති නිමි ඇඳුම්වල වටිනාකම | | | | |
| ණය පදනමට ලබා ගත් රෙදි තොගයේ මුදල | | | | |
| භාණ්ඩ තොග | | | | |

20. පහත සඳහන් අවස්ථාවලදී ගනුදෙනුවක්ද සිද්ධියක්ද වශයෙන් දී ඇති තොරතුරු වර්ගීකරණය කරන්න (√ ලකුණ යොදන්න).

| ගනුදෙනුව/සිද්ධිය | වර්ගීකරණය | |
|---|---|---|
| | ගනුදෙනුවකි | සිද්ධියකි |
| අත්පිට විකුණුම් රු.500,000 | | |
| මෝටර් රථ ක්ෂය ප්‍රමාණය රු.20,000 | | |
| කපා හළ බොල් ණය රු.10,000 | | |
| අත්පිට ගැණුම් රු.200,000 | | |
| ගෙවූ විදුලිබිල් රු.5,000 | | |